# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ගිණුම්කරණය - 33

## නිපුණතාව 10

හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා

ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය


## නිපුණතාව 10.0 : හවුල් ව්‍යාපාරයක, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 10.1 හවුල් ව්‍යාපාරයක ගිණුම්කරණයට අදාළ නෛතික පරිසරය පැහැදිලි කරයි | හවුල් ව්‍යාපාර හැඳින්වීම<br>• හවුල් ගිවිසුම<br>• අණපනත්<br>• 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත.<br>• 24 වගන්තිය<br>• 42 වගන්තිය<br>• 2007 අංක 07 දරන සමාගම් පනතේ 519 වගන්තිය | හවුල් ව්‍යාපාරයක් පැහැදිලි කරයි.<br>• හවුල් ගිවිසුම යන්න පැහැදිලි කර ගිණුම්කරණයට අදාළ ව කොන්දේසි ඉදිරිපත් කරයි.<br>• හවුල් ව්‍යාපාර හා සම්බන්ධව 1890 හවුල් ආඥා පනතේ 24 වගන්තියේ හා 42 වගන්තියේ වැදගත්කම සාකච්ඡා කරයි.<br>• හවුල් ගිවිසුමේ අන්තර්ගත නොවූ කරුණු සම්බන්ධයෙන් හවුල් ආඥා පනත බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• 2007 අංක 07 දරණ සමාගම් පනත හවුල් ව්‍යාපාරයකට වැදගත්වීමට බලපාන හේතුව දක්වයි |
| 10.2 හවුල් ව්‍යාපාරයකට විශේෂිත වූ ගනුදෙනු විග්‍රහ කරයි | • හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන දායකත්වය<br>• හවුල්කරුවන් කළමනාකරණයට දායක වීම<br>• අවදානම් දැරීම ලාභාලාභ හවුල්කරුවන් අතර බෙදා හැරීම<br>• හවුල්කරුවන් විසින් සපයන ණය | • හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් හවුල්කරුවන් සහභාගිවන විවිධ ආකාර පැහැදිලි කරයි.<br>• හවුල්කරුවන් සහභාගිත්වය අනුව ලබාදෙන ප්‍රතිලාභ වාර්තා කරන ආකාරය දක්වයි |
| 10.3 හවුල්කරුවන්ගේ හිමිකම් අනාවරණය කරයි. | • හවුල් ව්‍යාපාරයක හිමිකම<br>• ප්‍රාග්ධන ගිණුම<br>• ජංගම ගිණුම | • හවුල්කරුවන්ගේ හිමිකම දැක්වීමට පිළියෙල කළ යුතු ගිණුම් වර්ග නම් කරයි.<br>• ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම් පිළියෙල කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ප්‍රාග්ධන ගිණුමක හා ජංගම ගිණුම්වල ඇතුළත් කරන ගනුදෙනු වෙන්කර දක්වයි.<br>• ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කරයි.<br>• හවුල්කරුවන්ගේ හිමිකම අනාවරණය කරයි. |
| 10.4 හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කර, හවුල්කරුවන් අතර ලාභාලාභ විසර්ජනය කරයි. | • ආදායම් ප්‍රකාශනය<br>• ලාභාලාභ විසර්ජනය<br>• හවුල්කරුවන් අතර ලාභ අලාභ විසර්ජනය කරන ආකාර<br>• ප්‍රාග්ධන පොලී<br>• හවුල්කරුවන්ගේ වේතන | • හවුල් ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය (ලාභාලාභ) ගණනය කරයි.<br>• හවුල් ව්‍යාපාරයක ලාභය/අලාභය හවුල්කරුවන් අතර ව්‍යාප්ත වන ආකාරය දක්වයි.<br>• ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.<br>• ලාභ අලාභ විසර්ජනයට අදාළ අයිතම ජංගම ගිණුමට පිටපත් කරයි. |

| | | |
|---|---|---|
| | • හවුල්කරුවන්ගේ ලාභ අලාභ කොටස්<br>• ලාභ අලාභ විසර්ජනයන් ජංගම ගිණුමට පිටපත් කිරීම | |
| 10.5 හවුල්කරුවන් බඳවා ගැනීමේ දී, ඉවත්වීමේ දී සිදුවන ගනුදෙනු ගිණුම්ගත කරයි. | • ගැළපීම් කිරීමේ අවස්ථා<br>• හවුල් කරුවෙකු බඳවා ගැනීම<br>• හවුල් කරුවෙකු මියයාම හෝ ඉවත්වීම<br>• කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළ ගැලපීම (ගිණුම් කාලච්ඡේදය ආරම්භක දින හා අවසාන දින පමණක් අයිතිය වෙනස්වීම සැලකිල්ලට ගනියි ) | • හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස්වන අවස්ථා නම් කරයි.<br>• හවුල්කරුවන්ගේ අයිතිය වෙනස්වන අවස්ථාවක කීර්තිනාමය ගැළපුම් කළ යුතු බව පැහැදිලි කරයි.<br>• කීර්තිනාම ගිණුමක් විවෘත නොකර කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම තුළින් ගැළපුම් කරයි.<br>• කීර්තිනාමය ගැළපීමෙන් පසු ප්‍රාග්ධන ශේෂයට වන බලපෑම දක්වයි.<br>• ඉවත්වන හවුල්කරුවන් ගේ හිමිකම් කොටස ණයක් ලෙස රඳවාගත හැකි බව පෙන්වා දෙයි. |

# හවුල් ව්‍යාපාරයක, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

**සංකල්ප සිතියම**



## හවුල් ව්‍යාපාරයක ගිණුම්කරණයට අදාළ නෛතික පරිසරය

### හවුල් ව්‍යාපාරයක් යනු

1890 හවුල් ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යනු, ලාභ ලැබීමේ පරමාර්ථයෙන් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාවයයි.

**ඉහත නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක තිබිය යුතු ප්‍රධාන අංග කිහිපයකි.**

- පුද්ගලයින්
- පොදු එකඟතාව
- ව්‍යාපාරයක්
- ලාභ ලැබීමේ පරමාර්ථ

**හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වන නීතිමය අණ පනත් කිහිපයක් පහත දැක්වේ.**

- 1890 හවුල් ආඥා පනත
- 2007 අංක 7 දරණ සමාගම් පනතේ 519 වගන්තිය
- 1840 අංක 7 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත
- 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත

### හවුල් ගිවිසුමක් යනු

හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් අතර හවුල් ව්‍යාපාරය කරගෙන යන ආකාරය පිළිබඳ ඇතිකර ගන්නා පොදු එකගතාවක් සහිත ලියවිල්ලකි.

- හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් තිබේ නම්, එය වඩාත් යෝග්‍ය වේ.

**හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි ආකාර කිහිපයකි.**

- ලිඛිතව
- වාචිකව
- පාර්ශ්වයන්ගේ හැසිරීමෙන්

**හවුල් ගිවිසුමක ඇතුළත් කළ හැකි කොන්දේසි කිහිපයක් පහත දැක්වේ.**

- හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය
- හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය
- හවුල්කරුවන් ලාභාලාභ බෙදා ගන්නා ආකාරය
- හවුල්කරුවන්ගේ වේතන හිමිවන ආකාරය
- ප්‍රාග්ධන පොළී හිමිවන ආකාරය
- කීර්ති නාමය වාර්තා කරන ආකාරය
- හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතර ව ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා පොළී ගෙවන ආකාරය

**ලිඛිත ගිවිසුමක් නොමැති නම් හවුල් ආඥාපනතේ 24 වන වගන්තිය අනුව, ගිණුම්කරණ ගැටලු නිරාකරණය කළ යුතුය. 24 වන වගන්තියේ ඇතුළත් ගිණුම්කරණයට අදාළ ප්‍රධාන වගන්ති කිහිපයක් පහත දැක්වේ.**

1) ප්‍රාග්ධනයට කෙසේ දායක වී තිබුණ ද **ලාභාලාභ සමාන ව බෙදා ගත යුතු යි.**

2) හවුල්කරුවන් ප්‍රාග්ධනයට අතිරේක ව සපයා ඇති **ණය සඳහා 5% ක වාර්ෂික පොළියක්** හවුල්කරුවන්ට හිමි වේ.

3) පාලන කටයුතුවලට සෑම හවුල්කරුවෙක් ම සහාය විය යුතු අතර, ඒ සඳහා **වේතනයක් හිමි නොවේ.**

4) දායක වූ ප්‍රාග්ධනය සඳහා පොළි ලැබීමට කිසිදු හවුල්කරුවෙකුට හිමිකමක් නොමැත.

5) හවුල් ව්‍යාපාරයේ වියදමක් **හවුල්කරුවන් තම පුද්ගලික මුදලින් ගෙවා ඇත්නම්, ඒ මුදල ප්‍රතිපූරණය කිරීමේ හැකියාව හවුල්කරු සතු වේ.**


**1890 හවුල් ආඥා පනතේ 42 වගන්තිය අනුව,**
විශ්‍රාම යන / ඉවත් වන / මිය යන හවුල්කරුවන්ගේ හිමිකම් කොටස එදින නොගෙවන්නේ නම්, එදින සිට ගෙවන දින දක්වා කාලය සඳහා 5% ක වාර්ෂික පොළියක් ගෙවීම කළ යුතු ය.

**2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 වගන්තිය** අනුව යම් හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව 20 බවට සීමා කර ඇත.
**හවුල් ගිවිසුමක් නොමැති විට හෝ යම් කැරුණක් සම්බන්ධයෙන් ගිවිසුමෙහි සඳහන් නොවූ විට හවුල් ව්‍යාපාරයක යම් ගැටලුවක් යම් මතු වුවහොත් එම ගැටලුව ද හවුල් ආඥා පනතේ විධි විධාන අනුව විසඳා ගත යුතු ය.**

## හවුල් ව්‍යාපාරකට විශේෂිත වූ ගනුදෙනු

**හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් හවුල්කරුවන් සහභාගි වන විවිධ ආකාර හා හවුල්කරුවන්ගේ සහභාගිත්වය අනුව ලබා දෙන ප්‍රතිලාභ වාර්තා කරන ආකාරය.**

**සංකල්ප සිතියම**



## පැහැදිලි කිරීම්

- ප්‍රාග්ධනය සැපයීමෙන්, කළමනාකරණයට දායකත්වය දීම, අවදානම් දැරීම තුළින් හා ව්‍යාපාරයට ණය සැපයීම මඟින් හවුල් ව්‍යාපාරයට දායකත්වය සැපයිය හැකිය.
- වෙනත් ව්‍යාපාරයක / වෙනත් ආයෝජනයක් කැපකර, හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යොදා ඇති බැවින් ආවස්ථික පිරිවැය සංකල්පයට අනුව ප්‍රාග්ධන පොළී ගෙවීම වඩාත් යෝග්‍ය ය.
- එසේ ම කළමනාකරණයට දායකවීම, හා අවදානම් දැරීම ද හේතු වෙන් ප්‍රතිලාභ දීම යෝග්‍ය ය.
- හවුල් ව්‍යාපාර ගිවිසුම අනුව හවුල්කරුවන්ට, ප්‍රාග්ධනය යෙදීම නිසා පොළියත්, කළමනාකරණයට දායක වීම නිසා, වේතනත්, ප්‍රතිලාභ ලෙස ලැබෙන බව, අවදානම වෙනුවෙන් ලාභ කොටස හිමි ය.
- හවුල්කරු ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළී ලැබීම ද ප්‍රතිලාභයකි.
- හවුල්කරුවන් සපයන සේවාවන් අනුව ව්‍යාපාරයට විවිධ වූ ප්‍රයෝජන ලබා ගත හැකිය.
- හවුල් ව්‍යාපාරය විසින් හවුල්කරුවන්ට ලබා දෙන ප්‍රතිලාභ ව්‍යාපාරය උපයාගත් ශුද්ධ ලාභයෙන් බෙදාහරියි.

    ප්‍රාග්ධන පොළිය

    හවුල් වේතන


    ලාභ කොටස්

- මෙම ප්‍රතිලාභ ගෙවීම වියදම් ලෙස නොසලකන අතර, ඒවා ව්‍යාපාරයේ **ලාභය බෙදාහැරීමක්** ලෙස සැලකේ.
- හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළිය ව්‍යාපාරයේ වියදමක් සේ සලකයි. එයට හේතුව එම ණය මුදල ව්‍යාපාරයේ කටයුතු සඳහා ලබා ගන්නා බැවිනි.

# හවුල්කරුවන්ගේ හිමිකම් අනාවරණය කිරීම.

මෙහිදී හවුල්කරුවන්ගේ හිමිකම් දැක්වීමට පිළියෙල කළ යුතු ගිණුම්

**සංකල්ප සිතියම**



**හවුල් ව්‍යාපාර අභ්‍යාස 01**

**රංග, තරංග, සුරංග හවුල් ව්‍යාපාරයේ තොරතුරු හවුල් ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.**

1) ගිණුම් කාලච්ඡේදයක් ආරම්භයේ ඇති ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා 10% ක වාර්ෂික පොළියක් ගෙවීම.

2) රංගට සහ තරංගට මසකට රු. 20 000/ ක් බැගින් හවුල් වේතනයකට හිමිකම් ලබන අතර සුරංගට මසකට රු. 15 000/-ක වේතනයක් හිමි වේ.

3) හවුල්කරුවන් එකඟ වූ ප්‍රාග්ධනයට අමතර ව සපයා ඇති ණය සඳහා වාර්ෂික ව 10% ක පොළියක් හවුල්කරුවන්ට හිමි වේ.

| ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් (රු.) | ප්‍රාග්ධන පොළිය (රු.) | හිමිකමට ඇති කරන බලපෑම (රු.) |
|---|---|---|
| රංග 400 000 | ......................... . | ......................... |
| තරංග 300 000 | ......................... | ......................... |
| සුරංග 200 000 | ......................... | ......................... |

| | හවුල් වේතන | මුළු වේතනය | |
|---|---|---|---|
| රංග | 20 000 | ......................... | |
| තරංග | 20 000 | ......................... | ......................... |
| සුරංග | 15 000 | ......................... | |

රංග හවුල් ව්‍යාපාරයට හිමි ප්‍රාග්ධනයට අමතර ව සපයා ඇති ණය රු. 100 000 කි. පොළිය අඩු කළ පසු ශුද්ධ ලාභය රු. 900 000කි. එක් එක් හවුල්කරුගේ ලාභ කොටස්

| | | |
|---|---|---|
| රංග | ......................... | |
| තරංග | ......................... | ......................... |
| සුරංග | ......................... | |

**මෙම ගනුදෙනු මඟින් ඇති වන එක් එක් හවුල්කරුගේ හිමිකම**

| | | |
|---|---|---|
| රංග | ......................... | |
| තරංග | ......................... | ......................... |
| සුරංග | ......................... | |

එක් එක් හවුල්කරුවන්ගේ ගැනිලි රංග, තරංග හා සුරංග පිළිවෙලින් රු. 120 000 ක් රු. 100 000 ක් හා රු. 80 000 ක් වේ, නම් හිමිකමට ඇති කරන බලපෑම හා ප්‍රමාණය

| | බලපෑම | ප්‍රමාණය (වටිනාකම) | අවසාන හිමිකම |
|---|---|---|---|
| රංග | ............................ | ............................ | ............................ |
| තරංග | ............................ . | ........................... | ............................ |
| සුරංග | ............................ | ........................... | ............................ |

**හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම**

(රු.) (රු.)

| විස්තරය | රංග | තරංග | සුරංග | විස්තරය | රංග | තරංග | සුරංග |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**හවුල්කරුවන්ගේ ජංගම ගිණුම**

(රු.) (රු.)

| විස්තරය | රංග | තරංග | සුරංග | විස්තරය | රංග | තරංග | සුරංග |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම හා ප්‍රාග්ධන ගිණුම සිරස් ආකෘතියක් තුළ වුව ද ඉදිරිපත් කළ හැකි ය.

| විස්තරය | රංග | තරංග | සුරංග |
|---|---|---|---|
| | | | |

- හවුල් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හිමිකම ගණනය කිරීම සඳහා ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය වේ.
- ප්‍රාග්ධන ගිණුමේ ස්ථාවර හිමිකම් ලෙස වාර්තා කරන ලද පහත සඳහන් අයිතම ගැන පමණක් අවධානය යොමු කරයි.
  - ➢ ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය
  - ➢ අතිරේක ප්‍රාග්ධනය
  - ➢ එකඟතාව මත ප්‍රාග්ධන ආපසු ගැනීම්
  - ➢ කීර්තිනාමය ගැලපීම

- විචල්‍ය හිමිකම වාර්තාකරණ ගිණුම ජංගම ගිණුමයි. එහි පහත අයිතම ඇතුළත් කරයි.

  ප්‍රාග්ධන පොළී

  හවුල් වේතන

  ගැනිලි

  ලාභ කොටස් / අලාභ කොටස්

  හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා පොළිය

  හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් දරා ඇති ව්‍යාපාර වියදම්

- ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම වෙන් වෙන් ව තිබිය යුතු අතර ඒවා අනු තීරු ක්‍රමයට තබාගත යුතු ය.
- ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් හා ජංගම ගිණුම් ශේෂයන්ගේ එකතුව හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම නියෝජනය වේ.
- බාහිර පාර්ශ්ව විසින් සපයා ඇති ණය, හිමිකමක් නොව වගකීමක් ලෙස හඳුනා ගත යුතුය.

**හවුල් ව්‍යාපාර අභ්‍යාස 02**

උදා : රවී, මනී සහ සනී ගෙන යන හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ ඇතුළත් ප්‍රතිපාදන පහත දැක්වේ.

1. ගිණුම් කාලච්ඡේදයේ ආරම්භයේ ඇති ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් සඳහා වර්ෂයකට 10% ක පොළී ගෙවනු ඇත.
2. සෑම හවුල්කරුවෙක් ම මසකට රු. 30 000/- බැගින් හවුල් වේතන හිමිකම් ලබයි.
3. ප්‍රාග්ධනයට අතිරේක ව හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා 10% ක පොළී ගෙවන අතර ලාභාලාභ සමාන ව බෙදා ගනී.
4. 2018/04/01 දිනට හවුල්කරුවන්ගේ පෞද්ගලික ගිණුම් ශේෂයන් මෙසේය.

| | රවී | මනී | සනී |
|---|---|---|---|
| ප්‍රාග්ධනය (රු.'000) | 5 000 | 4 000 | 4 000 |
| මුළු හිමිකම (රු.'000) | 5 400 | 4 200 | 3 700 |


5. 2019/03/31 දිනෙන් අවසන් වර්ෂයේ එක් එක් හවුල්කරු පහත ගැනිලි සිදු කර ඇත.

| | |
|---|---|
| රවී රු. | 480 000 |
| මනී රු. | 500 000 |
| සනී රු. | 320 000 |

6. 2018/04/01 දින මනී සපයා ඇති ණය ගිණුමේ ශේෂය රු. 200 000 කි.
7. ණය පොළී අඩු කිරීමට පෙර රු. 2 580 000 ක ශුද්ධ ලාභයක් 2019/03/31 දිනෙන් අවසන් වර්ෂයේ දී හවුල් ව්‍යාපාරය උපයා ඇත.
8. 2019/03/30 දින එක් එක් හවුල්කරුවන් රු. 1 000 000 බැගින් ආයෝජනය කර ඒ මුදලින් එදින ම යන්ත්‍රයක් ලබා ගෙන ඇත.

- හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්න.

## හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කර, හවුල්කරුවන් අතර ලාභාලාභ විසර්ජනය කිරීම.




හවල් ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙළ කරයි.
හවුල් ව්‍යාපාරයක අයිතිය කිහිප දෙනෙකු සතු වන නිසා ශුද්ධ ලාභය හවුල්කරුවන් අතර බෙදාහැරීම කළ යුතු ය (විසර්ජනය කළ යුතු ය)

- හවුල් ගිවිසුමට අනුව ගිණුම් කාලච්ඡේදයට අදාළ වූ පහත සඳහන් අයිතම ලාභාලාභ විසර්ජන ප්‍රකාශයනට ඇතුළත් කරයි.

  - ප්‍රාග්ධන පොළිය
  - හවුල් වේතන
  - සංචිත සඳහා වෙන්කිරීම
  - ලාභ / අලාභ කොටස්

- ඉහත අයිතමවලට අදාළ ද්විත්ව සටහන වන්නේ

  ලාභාලාභ විසර්ජන ගිණුම හර

  ජංගම ගිණුම බැර

- හවුල්කරුවන්ට හිමි යම් ප්‍රමාණ හිමිකමක් ඔවුන් මුදලින් ලබා ගෙන ඇත්නම්,

  ජංගම ගිණුමට හර කර

  මුදල් ගිණුමට බැර කරන්න.

- ලාභාලාභ විසර්ජන ගිණුම් ඇතුළත් අයිතමවල ද්විත්ව සටහන සම්පූර්ණ කිරීම සඳහා මෙන් ම, හවුල්කරුවන්ගේ විචල්‍ය හිමිකම පෙන්වීම සඳහා ජංගම ගිණුම් භාවිත කරයි.

- ඉහත තොරතුරුවලට අනුව ප්‍රභා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය, ලාභාලාභ විසර්ජන ගිණුම, හා ජංගම ගිණුම පහත ආකාරයට සකස් කළ හැකි ය.

  - වැදගත් - **හවුල් ව්‍යාපාරයක හවුල් කරුවකු ප්‍රාග්ධනයට අමතරව සපයන ණය මුදල් සඳහා අදාල පොලිය මූල්‍ය වියදම් යටතේ දැක්විය යුතුය.**

**ලාභාලාභ විසර්ජන ගිණුම**

| | | | | රු. |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන පොළී A | × | | ශුද්ධ ලාභ ඉ/ගෙ | × × × |
| B | × | × × | | |
| හවුල් වේතන A | × | | | |
| B | × | × × | | |
| ලාභ කොටස් A | × | | | |
| B | × | × × | | |
| | | × × × | | × × × |

**ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය**

| | | | රු. |
|---|---|---|---|
| ශුද්ධ ලාභය | | | × × × |
| ප්‍රාග්ධන පොළී A | × | | |
| B | × | × × | |
| හවුල් වේතන A | × | | |
| B | × | × × | (× ×) |
| ලාභ කොටස් A | × | | |
| B | × | × × | (× ×) |
| | | | - |

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 03)**

**2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ**
**ව්‍යාපාර දෙකක තොරතුරු**

| ප්‍රභා ව්‍යාපාරය (රු.000') | | | | රවී ව්‍යාපාරය (රු.000') |
|---|---|---|---|---|
| 1 000 | ප්‍රමිතා | ප්‍රාග්ධනය | රශ්මි | 1 200 |
| 800 | භාරත | | වින්දන | 1 000 |
| 200 | ප්‍රමිතා | ජංගම ගිණුම් | රශ්මි | 300 |
| 100 | භාරත | | වින්දන | 200 |
| 150 | ප්‍රමිතා | ගැනිලි | රශ්මි | 100 |
| 50 | භාරත | | වින්දන | 100 |
| 2 500 | -------- | විකුණුම් | --------- | 3 000 |
| 1 000 | --------- | විකුණුම් පිරිවැය | --------- | 1 300 |
| 200 | --------- | පරිපාලන වියදම් | --------- | 300 |
| 100 | --------- | බෙදාහැරීමේ වියදම් | --------- | 150 |
| 90 | --------- | වෙනත් වියදම් | --------- | 80 |
| 50 | --------- | මූල්‍ය වියදම් | --------- | 70 |
| 500 | ප්‍රමිතා | ව්‍යාපාරයට දුන් ණය | රශ්මි | 300 |
| 10% | --------- | ණය සඳහා පොළිය | --------- | - |
| 5% | --------- | ප්‍රාග්ධන පොළිය | --------- | - |
| 10 | --------- | හවුල් වේතන මසකට | | - |
| 700 | භාරත | හවුල් ව්‍යාපාරයෙන් ගත් ණය | --- | |
| 10% | --------- | ගත් ණය සඳහා පොළිය | --- | |
| 2 : 1 | ප්‍රමිතා : භාරත | ලාභාලාභ අනුපාතය | | --- |

ඉහත හවුල් ව්‍යාපාර දෙකට අදාලව ආදායම් හා විසර්ජන ප්‍රකාශ හෝ ගිණුම් පිළියෙළ කර ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්න.

(හවුල් ව්‍යාපාර අභ්‍යාස 04)

අමර කමල් හා නිමල් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2019-12-31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ගිවිසුම හා ශේෂ පිරික්ෂුම පහත දැක්වේ

1) අමර කමල් හා නිමල් පිළිවෙලින් 2:1:1 යන අනුපාතයට ලාභ අලාභ බෙදා ගැනීම
2) ආරම්භක ප්‍රාග්ධනශේෂයන් මත 10% ක පොළී හිමිවීම
3) සෑම හවුල් කරුවකුටම මසකට රු 2000 බැගින් වේතන ගෙවීම
4) ගැනිලි සඳහා 5% ක පොලි අයකිරීම

හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්ෂුම පහත දැක්වේ.

| | හර (රු) | බැර(රු) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය | 600 000 | - |
| මොටර් රථ පිරිවැය හා ක්ෂය වෙන්කිරීම | 300 000 | 50 000 |
| ගෘහ භාණ්ඩ පිරිවැය හා ක්ෂය වෙන්කිරීම | 100 000 | 30 000 |
| පරිගණක පිරිවැය හා ක්ෂය වෙන්කිරීම | 100 000 | 20 000 |
| ගැනුම් හා විකුණුම් | 350 000 | 650 000 |
| ආපසු එවුම් හා ආපසු යැවුම් | 20 000 | 40 000 |
| ගෙනඒමේ කුලි | 10 000 | - |
| 2019-01-01 තොගය | 50 000 | - |
| විදුලි ගාස්තු | 10 000 | - |
| සේවක වැටුප් | 20 000 | - |
| ප්‍රචාරන වියදම් | 15 000 | - |
| විවිධ ආදායම් | - | 150 000 |
| රක්ෂන හා වරිපනම් | 10 000 | - |
| වෙළඳ ණයගැතියන් හා ණයහිමියන් | 55 000 | 40 000 |
| දුන් වට්ටන් හා ලද වට්ටන් | 5 000 | 10 000 |
| ජංගම ගිණුම් - අමර | - | 50 000 |
| කමල් | - | 30 000 |
| නිමල් | - | 20 000 |
| ගැනිලි ගිණුම් - අමර | 30 000 | - |
| කමල් | 20 000 | - |
| නිමල් | 20 000 | - |
| 12% බැංකු ණය | - | 100 000 |
| ගෙවූ බැංකු ණය පොලි | 5 000 | - |
| ප්‍රාග්ධන ගිණුම් - අමර | - | 300 000 |
| කමල් | - | 200 000 |
| නිමල් | - | 200 000 |
| බැංකු ශේෂය | 70 000 | - |
| මුදල් ශේෂය | 100 000 | - |
| | **1890 000** | **1890 000** |

අතිරේඛ තොරතුරු

1) 2019-12-31 දිනට තොගය පිරිවැය රු 60 000 කි එහි ශුද්ධ උපලබ්ධි අගය රු 50 000 කි

2) 2019-12-31 දිනට විදුලි ගාස්තු රු 3 000 ක් උපචිත වන අතර රක්ෂණ හා වරිපනම් රු 2 000 ක් ඉරියට ගෙවා ඇත.

3) ස්ථාවර වත්කම් පහත පරිදි ක්ෂය කරන්න

මොටරර් රථ පිරිවරයට 10% / ගෘහ භාණ්ඩ පිරිවැයට 5% / පරිගණක පිරිවැයට 20%ක් වශයෙනි.

4) වෙළඳ ණයගැතියන්ගෙන් රු 5 000 ක් බොල්ණය ලෙස කපා හරින්න.


අවශ්‍ය වන්නේ

1) 2019-12-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා විසර්ජන ප්‍රකාශය

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2019-12-31 ට මූල්‍ය තත්ව ප්‍රකාශය.

## හවුල්කරුවන් බඳවා ගැනීමේ දී, ඉවත් වීමේ දී සිදුවන ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කිරීම.



## හවුල් ව්‍යාපාරයකට ගිණුම් කාලච්ඡේදය ආරම්භක දින හා අවසාන දින හවුල්කරුවෙකු බඳවා ගන්නේ නම්, ඇති වන තත්ත්වයන්, හා ගත යුතු ක්‍රියා මාර්ග හා ගිණුම් තබන ආකාරය

**කීර්තිනාමය ගැලපීම** ----------- නව හවුල්කරුවකු බඳවා ගැනීමේදී කීර්තිනාමය පහත පරිදි ගිණුම්ගත කරයි.

**මුළු කීර්තිනාමයේ වටිනාකම**

| |
|---|
| සියලුම හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හර<br>(නව අනුපාතයට)<br>පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් බැර<br>(පැරණි අනුපාතයට) |

**නව හවුල්කරුවන්ගේ කීර්තිනාම කොටස**

| |
|---|
| නව හවුල්කරු ප්‍රාග්ධන ගිණුම - හර<br>පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් - බැර<br>(කැප කළ අනුපාතයට) |

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 05)**

මලිඳු, හා නිසාන් ලාභ අලාභ සමසමව බෙදාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2019-04-01දින ප්‍රනීත් බඳවා ගන්නා ලදී
හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ කොන්දේසි මෙසේය.

- ලාභ ලාභ අනුපාතය 3 : 2 : 1
- මාසික හවුල් වේතන - මලිඳු රු. 3 000, නිසාන් රු. 2 000 ප්‍රනීත්, රු. 4 000
- ප්‍රාග්ධන පොළී - වාර්ෂිකව 10% (නව හා පැරණි ගිවිසුම)
- ණය සඳහා පොළී 10% (නව හා පැරණි ගිවිසුම)

- 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ උපුටා ගත් තොරතුරු කිහිපයක් මෙසේ ය.

| | | රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 1 000 000 |
| විකුණුම් පිරිවැය | | 600 000 |
| පරිපාලන වියදම් | | 50 000 |
| බෙදාහැරීමේ වියදම් | | 30 000 |
| මූල්‍ය වියදම් | | 15 000 |
| වෙනත් වියදම් | | 4 000 |
| මලිඳුගේ ණය | | 80 000 |
| මලිඳුට ගෙවූ ණය පොළී | | 4 000 |
| බොල් ණය | | 5 000 |
| ප්‍රාග්ධනය- | මලිඳු | 400 000 |
| (2019.4.1 දිනට) - | නිසාන් | 300 000 |

| | | |
|---|---|---|
| | ප්‍රනීත් | 200 000 |
| ගැනිලි - | මලිදු | 20 000 |
| - | නිසාන් | 10 000 |

- 2019/04/01 දිනට ජංගම ගිණුමේ ශේෂ

| | | |
|---|---|---|
| | මලිදු | 30 000 |
| - | නිසාන් | 20 000 |

- හවුල්කරුවන්ගේ අයිතිය වෙනස් වූ දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 120 000 ක් ලෙස තක්සේරු කර ඇත.
- මලිදු ණය සපයා ඇත්තේ 2019/04/01 දින වන අතර ඒ සඳහා ගෙවා ඇත්තේ මාස 6 ක පොළිය පමණි.

අවශ්‍ය වන්නේ
01) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය** පිළියෙල කිරීම

02) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙළ කිරීම.

## හවුල් ව්‍යාපරයකින් හවුල් කරුවෙක් ඉවත්වීමේදී හෝ විශ්‍රාම යාමේදී කීර්තිනාමය ගිණුම් තබන ආකාරය

තක්සේරු කරන ලද මුළු කීර්තිනාම වටිනාකම

| |
|---|
| සිටින හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හර<br>(නව අනුපාතයට)<br>පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් බැර<br>(පැරණි අනුපාතයට) |

**ඉවත්වන හවුල්කරුවන්ගේ කීර්තිනාම කොටස**

| |
|---|
| සිටින හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් - හර<br>ඉවත්ව යන හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම - බැර<br>(කැප කළ අනුපාතයට) |

නිදසුන්

කමල්, නිමල් හා සුරංග 5:3:2 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් ගෙනගිය හවුල් ව්‍යාපාරයෙන් සුරංග ඉවත් විය . එදින කීර්තිනාමය රු 200 000 කට තක්සේරු කර ගිණුම් ගත කිරීමට එකගවිය. කමල් හා නිමල් 3:2 අන්පාතයට ලාභ අලාභ බෙදාගනිමින් යවුල් ව්‍යාපාරය දිගටම කරගෙන යාමට එකගවිය. ප්‍රාග්ධන ගිණුම් ශේෂ කමල් රු 500000 ක්ද නිමල් රු 400 000 ක්ද සුරංග රු 300000 එදිනට විය.

කීර්තිනාමය ගිණුම්ගත කිරීමට අදාල ගැලපුම් සහිත ප්‍රාග්ධන ගිණුම පෙන්වන්න.

## (හවුල් ව්‍යාපාර අභ්‍යාස 06)

අමර, හා මාලා හා රාණි 5:3:2 ලාභ අලාභ බෙදාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2019-04-01දින රාණි ඉවත්වන ලදී
හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ කොන්දේසි මෙසේය.

- නව ලාභ ලාභ අනුපාතය 3 : 2
- මාසික හවුල් වේතන - අමර රු. 3 000, මාලා රු. 2 000
- ප්‍රාග්ධන පොළී - වාර්ෂිකව 10% (නව හා පැරණි ගිවිසුම)
- ණය සඳහා පොළී 10% (නව හා පැරණි ගිවිසුම)

- 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ උපුටා ගත් තොරතුරු කිහිපයක් මෙසේ ය.

| | | රු. |
|---|---|---|
| විකුණුම් ආදායම | | 1 200 000 |
| විකුණුම් පිරිවැය | | 700 000 |
| පරිපාලන වියදම් | | 50 000 |
| බෙදාහැරීමේ වියදම් | | 30 000 |
| අදරගේ ණය | | 100 000 |
| මුල්‍ය වියදම් | | 15 000 |
| වෙනත් වියදම් | | 4 000 |
| මලිදුට ගෙවූ ණය පොළී | | 5 000 |
| බොල් ණය | | 5 000 |
| ප්‍රාග්ධනය- | අමර | 400 000 |
| (2019.4.1 දිනට) - | මාලා | 300 000 |
| | රාණි | 200 000 |
| ගැනිලි - | අමර | 20 000 |
| - | මාලා | 10 000 |

- 2019/04/01 දිනට ජංගම ගිණුමේ ශේෂ

| | | |
|---|---|---|
| | අමර | 30 000 |
| - | මාලා | 20 000 |
| | රාණි | 20 000 |

- හවුල්කරුවන්ගේ අයිතිය වෙනස් වූ දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 150 000 ක් ලෙස තක්සේරු කර ඇත.
- අමර ණය සපයා ඇත්තේ 2019/04/01 දින වන අතර ඒ සඳහා ගෙවා ඇත්තේ මාස 6 ක පොළිය පමණි.

රාණිට හිමිවියයුතු මුදලින් රු 150 000 ක් ගෙවීමටත් ඉතිරිය ණය ගිණුමකට මාරු කිරීමටත් එකග විය. අවශ්‍ය වන්නේ

01) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය** පිළියෙල කිරීම

02) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙළ කිරීම.

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 07)**

(1) පහත සඳහන් වගන්ති සත්‍ය ද අසත්‍ය ද සඳහන් කිරීම.

(අ) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හිමිකම් ගිණුම් වර්ගයකි ( )

(ආ) ගැනිලි නිසා හවුල්කරුවන්ගේ හිමිකම වෙනස් නොවේ. ( )

(ඇ) හවුල්කරුවෙකුට ගෙවිය යුතු ණය සඳහා පොළිය ලාභ ( )

විජර්ජනයට යොදා නොගනී.

 පහත වගන්තිවල හිස්තැන් පිරවීම

(අ) ලාභාලාභ විසර්ජන ගිණුම මඟින් පෙන්නුම් කරන්නේ ............................................................................ යි.

(ආ) ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවෙකු දැරූ වියදම්වල වටිනාකම් ...................................ගණි මු ට ..................................................... කරයි.

(02) 2020/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ලෙජරයෙන් උපුටාගත් ශේෂ කිහිපයක්

පහත දැක්වේ.

 ප්‍රාග්ධන ගිණුම් 2019. 04. 01 - අමල් රු. 600 000 - කමල් රු. 450 000

 ජංගම ගිණුම් 2019. 04. 01 - අමල් රු. 50 000 - කමල් රු. (20 000)

 2019. 04. 01 දින රු. 400 000 ක් යොදමින් නිමල් ව්‍යාපාරයට බඳවා ගනියි.

 එදිනට ව්‍යාපාරයේ කීර්ති නාමය රු. 60 000 ක් ලෙස තක්සේරු කරන ලදී.

 පැරණි ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය පිළිවෙලින් අමල් හා කමල් 3 : 2 වේ.

 නව ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය පිළිවෙලින් අමල් කමල් හා නිමල් 5 : 3 : 2 වේ.

කීර්ති නාමය ගැලපීම ප්‍රාග්ධන ගිණුම් තුළින් පෙන්වන්න

ඉහත හවුල් ව්‍යාපාරයේ කාලච්ඡේදයේ ලාභය රු. 450 000 ක් නම්, ලාභය විසර්ජනය කිරීම පෙන්වන්න.

(හවුල් ව්‍යාපාර අභ්‍යාස 08)

මාලා හා රාමා සමසමව ලාභ අලාභ බෙදාගනිමින් ගෙනයන හවුල් ව්‍යාපාරයට 2020-01-01 දින සාමා බඳවා ගන්නා ලදී ඔවුන්ගේ නව හවුල් ගිවිසුම පහත දැක්වේ.

1) මාලා රාමා හා සාමා 2 :1: 1 යන අනුපාතයට ලාභ අලාභ බෙදා ගැනිම
2) ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක පොලි ගෙවීම
3) මාලාට රාමාට හා සාමාට පිළිවෙලින් රු 2 000 /15 00 / 1000 බැගින් මාසික වේතන ගෙවීම
4) ගැනිලි සඳහා 5% ක පොලි අය කිරීම
2020-12-31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්ෂුම පහත දැක්වේ

| | හර (හර) | බැර (රු) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය | 500 000 | - |
| මෝටර් රථ පිරිවැය හා ක්ෂය වෙන් කිරීම | 400 000 | 100 000 |
| ගෘහභාණ්ඩ පිරිවැය හා ක්ෂය වෙන් කිරීම | 200 000 | 40 000 |
| පරිගණක පිරිවැය හා ක්ෂය වෙන් කිරීම | 150 000 | 20 000 |
| 2020-01-01 ට තොගය | 70 000 | - |
| ආයතන හා පරිපාලන වියදම් | 25 000 | - |
| විකුණුම් හා බෙදාහැරීමේ වියමි | 30 000 | - |
| මූල්‍ය හා වෙනත් වියදම් | 20 000 | - |
| ගැනුම් හා විකුණුම් | 300 000 | 600 000 |
| ජංගම ගිණුම් - මාලා | - | 50 000 |
| රාමා | - | 40 000 |
| හවුල් කරුවන්ගේ ගැනිලි මාලා | 30 000 | - |
| රාමා | 20 000 | - |
| සාමා | 20 000 | - |
| ප්‍රාග්ධන ගිණුම් - මාලා | - | 300 000 |
| රාමා | - | 200 000 |
| සාමා ගෙන ආ මුදල | - | 200 000 |
| 10% බැංකු ණය | - | 200 000 |
| වෙනත් ආදායම් | - | 150 000 |
| වෙළඳ ණයගැතියන් හා ණය හිමියන් | 105 000 | 70 000 |
| අඩමාණ ණය වෙන්කිරීම 2020-01-01 | - | 8 000 |
| බැංකු ශේෂය | 50 000 | - |
| මුදල් ශේෂය | 48 000 | - |
| | **1978 000** | **1978 000** |

අතිරේඛ තොරතුරු

1) 2020-12-31 ට අවසන් තොගය රු 100 000 කි
2) බැංකු ණය පොලි උපචිතව ඇත.
3) ස්ථාවර වත්කම් පහත පරිදි ක්ෂය කළ යුතුය
මෝටර් රථ ගිනවන ශේෂ ක්‍රමයට 10% කි /ගෘහ භාණ්ඩ පිරිවැයට 5% කි /පරිගනක පිරිවැයට 20% කි
4) රු 5 000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතු අතර ඉතිරි නය ගැතියන්ගෙන් 10% ක් වන පරිදි අඩමාන ණය වෙන් කිරීම
අවශ්‍ය වන්නේ

1) 2020-12-31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා විසර්ජන ප්‍රකාශය

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2020-12-31 ට මූල්‍ය තත්ව ප්‍රකාශය.

(හවුල් ව්‍යාපාර අභ්‍යාස 09)

## කීර්තිනාමය ගැලපීම බඳවාගැනීමට අදාලව

මාලා හා අමර 3: 2 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් ගෙනගිය හවුල් ව්‍යාපාරයට 2020-01-01දින නයනා බඳවා ගන්නා ලදි. එදින ව්‍යාපාරයේ කීර්තිනාමය රු 300 000 කට තක්සේරු කර පොත්වල පවත්වාගෙන යාමට පැරණි හවුල් කරුවෝ එකග විය.

නව හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත දැක්වේ.

1) ලාභ අලාභ මාලා, අමර නයනා අතර පිළිවෙළින් 5:3:2 පරිදි බෙදා ගැනීම.

2) ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10% ක පොලි ගෙවීම

3) සෑම හවුල්කරුවකුටම සමකට රු 3000 බැගින් වේතන ගෙවීම

4) ගැනිලි සඳහා 5% ක පොලි අයකිරීම.

2020-12-31 න් අවසන් වර්ෂය සඳහා උපුටා ගත් ශේෂ පිරික්ෂුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| 2020-12-31 න් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය | | 400 000 |
| දේපල පිරියත උපකරන පිරිවැය | 800 000 | - |
| දේපල පිරියත උපකරන ක්ෂය වෙන්කිරීම් | - | 100 000 |
| ජංගම ගිණුම් මාලා | - | 50 000 |
| අමර | - | 40 000 |
| ප්‍රාග්ධන ගිණුම් මාලා | - | 300 000 |
| අමර | - | 200 000 |
| නයනා ගෙන ආ මුදල | - | 200 000 |
| ගැනිලි ගිණුම් මාලා | 40 000 | |
| අමර | 30 000 | |
| නයනා | 30 000 | |
| ණයගැතියන් හා ණයහිමියන් | 100 000 | 80 000 |
| බැංකු ණය | - | 200 000 |
| 2020-12-31 තොගය | 150 000 | - |
| ආයෝජන | 200 000 | - |
| බැංකු ශේෂය | 150 000 | - |
| මුදල් ශේෂය | 70 000 | |
| | **1570 000** | **1570 000** |

අවශ්‍ය වන්නේ

1) 2020-12-31 න් අවසන් වර්ෂය සඳහා විසර්ජන ප්‍රකාශය

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2020-12-31 ට මුල්‍ය තත්ව ප්‍රකාශය.

(හවුල් ව්‍යාපාර අභ්‍යාස 10)

## බඳවාගැනීම් හා විශ්‍රාම යාම

නිමල් , අමර හා කමල් 2:1:1 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් ගෙනගිය හවුල් ව්‍යාපාරයෙන් 2020-12-31දින කමල් විශ්‍රාම ගත් අතර එදිනම සුනිල් නව හවුල් කරුවකු ලෙස බඳවා ගන්නා ලදී. එදින ව්‍යාපාරයේ කීර්තිනාමය රු 400 000 කට තක්සේරු කර පොත්වල පවත්වාගෙන නොයාමට පැරණි හවුල් කරුවෝ එකග විය.

නව හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත දැක්වේ.

1) ලාභ අලාභ හවුල් කරුවන් අතර පිළිවෙලින් නිමල් අමර හා සුනිල් අතර 2:2:1 අනුපාතයට බෙදා ගැනිම.

2) ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10% ක පොලි ගෙවීම

3) සෑම හවුල්කරුවකුටම සමකට රු 2000 බැගින් වේතන ගෙවීම

4) ගැනිලි සඳහා 5% ක පොලි අයකිරීම.

2020-12-31 න් අවසන් වර්ෂය සඳහා උපුටා ගත් ශේෂ පිරික්ෂුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| 2020-12-31 න් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය | | 600 000 |
| දේපල පිරියත උපකරන පිරිවැය | 1000 000 | - |
| දේපල පිරියත උපකරන ක්ෂය වෙන්කිරීම් | - | 100 000 |
| ජංගම ගිණුම් නිමල් | - | 50 000 |
| අමර | - | 40 000 |
| කමල් | - | 40 000 |
| ප්‍රාග්ධන ගිණුම් නිමල් | - | 300 000 |
| අමර | - | 200 000 |
| කමල් | - | 200 000 |
| ගැනිලි ගිණුම් නිමල් | 50 000 | - |
| අමර | 30 000 | - |
| කමල් | 20 000 | - |
| සුනිල් ගෙන ආ මුදල | - | 200 000 |
| ණයගැතියන් හා ණයහිමියන් | 100 000 | 80 000 |
| බැංකු ණය | - | 100 000 |
| 2020-12-31 තොගය | 150 000 | - |
| ආයෝජන | 200 000 | - |
| බැංකු ශේෂය | 150 000 | - |
| මුදල් ශේෂය | 210 000 | |
| | **1910 000** | **1910 000** |

අතිරේඛ තොරතුරු

1) කමල්ට ලැබියයුතු මුදල ණය ගිණුමකට මාරුකිරීමටත් රු 150 000 ක් එදින මුදලින් ගෙවීමත් සිදුවිය

අවශ්‍ය වන්නේ

1) 2020-12-31 න් අවසන් වර්ෂය සඳහා විසර්ජන ප්‍රකාශය

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2020-12-31 ට මුලය තත්ව ප්‍රකාශය.

(හවුල් ව්‍යාපාර අභ්‍යාස 11)

## හවුල් ව්‍යාපාර ගිණුම් බඳවා ගැනීම් හා ඉවත් වීම්

A හා B 2:1 අනුපාතයට ලාභ අලාභ බෙදාගනිමින් ගෙන යන හවුල් ව්‍යාපාරයෙන් 2020-12-31 දින B ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත්තේය. එදිනම ලාභයෙන් භාගයක් දීමේ පොරොන්දුව පිට C ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.

මෙදින කීර්තිනාමය රු 150 000 කට අගය කළ අතර කීර්තිනාම ගිණුමක් පොත්වල නොපවත්වාගෙන යාමට හවුල් කරුවෝ තිරණය කලේය.

හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුම පහත දැක්වේ

1 ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10% ක පොලි හිමිවීම

2 සෑම හවුල් කරුවකුටම මසකට රු 2500 බැගින් වේතන ගෙවීම.

3 ගැනිලි මත 5% පොලි අයකිරීම

2020-12-31 දි ඒ ට ව්‍යාපාරයෙන් හිමිවිය යුතු කොටස නය ගිණුමකට මාරු කිරීමටත් තිරණය විය

ABC ගේ හවුල් ව්‍යාපාරයේ 2020/12/31 දිනට ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගත් ශේෂ පිරික්ෂුම පහත දැක්වේ

| | | | |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | | 500 000 | - |
| මෝටර් රථ පිරිවැය හා ක්ෂය වෙන් කිරිම | | 200 000 | 50 000 |
| කාර්යාල උපකරණ පිරිවැය හා ක්ෂය වෙන් කිරිම | | 100 000 | 30 000 |
| ගැණුම් හා විකුණුම් | | 500 000 | 900 000 |
| ආපසු එවුම් හා ආපසු යැවුම් | | 20 000 | 50 000 |
| ගෙනඒමේ කුලි | | 10 000 | - |
| ආනයන තිරු ගාස්තු | | 20 000 | - |
| 2020/01/01 ට තොගය | | 50 000 | - |
| ගැනිලි | A | 40 000 | |
| | B | 30 000 | |
| ප්‍රචාරන වියදම් | | 10 000 | - |
| රක්ෂණ හා වරිපණම් | | 5 000 | - |
| ජංගම ගිණුම් | A | - | 30 000 |
| | B | - | 20 000 |
| විදුලි ගාස්තු | | 3 000 | - |
| දුරකථන ගාස්තු | | 2 000 | - |
| සේවක වැටුප් හා වේතන | | 10 000 | - |

| | | | |
|---|---|---|---|
| ණය ගැතියෝ හා ණය හිමියෝ | | 110 000 | 80 000 |
| අඩමාන ණය වෙන් කිරීම 2020/01/01 ට | | - | 7 000 |
| විකුණුම් වියදම් | | 10 000 | - |
| කුලී ආදායම් | | - | 20 000 |
| විවිධ ආදායම් | | - | 10 000 |
| බැංකු | | 200 000 | |
| මුදල් | | 77 000 | - |
| ප්‍රාග්ධනය | A | - | 300 000 |
| | B | | 200 000 |
| C ගෙන ආ මුදල | | | 200 000 |
| | | **1897 000** | **1897 000** |

අතිරේක තොරතුරු ඔබට සපයා ඇත.

1 2020/12/31 දිනට තොගය රු 90 000 කට තක්සේරු කර ඇත.

2 විදුලි ගාස්තු රු 2 000 ක්ද දුරකථන ගාස්තු රු 1 000 ක්ද වර්ෂයට අදාලව ගෙවියයුතුව ඇත.

3 රක්ෂණ ගාස්තු රු 1000 ක් ඉදිරි වර්ෂය සඳහාය

4 ණය ගැතියන්ගෙන් රු 10 000 ක් බොල්ණය ලෙස කපා හැරියයුතු අතර ඉතිරි ණය ගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම

5 මෝටර් රථ වාර්ෂිකව පිරිවැයට 10% ක්ද කාර්යාල උපකරණ පිරිවැයට වාර්ෂිකව 5% ක්ද ක්ෂය කිරීම

අවශ්‍යවන්නේ

1) 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා AB හා C ගේ හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය හා විසර්ජන ගිණුම

2) හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

3) 2020-12-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 12)**

(i) හර්ෂ, සඳුන්, තාමර හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුමේ සඳහන් කොන්දේසි පහත පරිදි වේ.

(අ) ලාභලාභ 3:2:1 අනුපාතයට බෙදා ගනී.

(ආ) මාසික වැටුප් පිලිවෙළින් 3000,2000,1000 වේ.

(ඇ) ආරම්භක ප්‍රාග්ධන ශේෂ වෙනුවෙන් 5 ක පොලියක් ලබා දේ.

(ii) 2019.04.01 දින තාමර ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදී.

(අ) නව ලාභාලාභ අනුපාතය හර්ෂ, සඳුන් පිළිවෙළින් 2:1 වේ.

(ආ) මාසික වැටුප් පිලිවෙලින් 5 000.00, 3 000.00 වේ.

(ඇ)ගිවිසුමේ අනෙකුත් කරුණු වෙනස් නොවේ.

(iii) තාමර විශ්‍රාම ගන්නා දින කීර්තිනාමය රු.60 000 කට අගය කරන ලදී. කීර්තිනාමය වුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මගින් ගලපනු ලැබේ

31.03.2020 දිනට ශේෂ පිරික්සුම

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| හර්ෂ | - | 120 000 |
| සඳුන් | - | 120 000 |
| තාමර | - | 140 000 |
| ජංගම ගිණුම | | |
| හර්ෂ | - | 25 000 |
| සඳුන් | 30 000 | - |
| තාමර | - | 10 000 |
| ගැනිලි | | |
| හර්ෂ | 15 000 | - |
| සඳුන් | 18 000 | |
| තාමර | 12 000 | |
| තොගය - 01/04/2019 | 26 000 | |
| ගැනුම් හා විකුණුම් | 384 000 | 818 000 |
| සේවක වැටුප් | 64 000 | |
| විදුලි ගාස්තු | 17 000 | |
| රක්ෂණ ගාස්තු | 12 000 | |
| වරිපනම් | 5 000 | |
| වට්ටම් | 3 000 | |
| බොල් හා අඩමාණ ණය සඳහා ලියා හැරීම- 01/04/2019 | 2 000 | 9 000 |
| වෙළඳ ලැබිය යුතු දෑ හා වෙළඳ ගෙවිය යුතු දෑ | 135 000 | 200 000 |
| දේපළ පිරියත හා උපකරණ | 1000 000 | 300 000 |
| මුදල් | 19 000 | |
| | 1 742 000 | 1 742 000 |

 හර්ෂ විසින් රු.130 000 ක මුදලක් තාමරට විශ්‍රාම ගැන්වීම සඳහා ගෙවන ලදී.

 තාමරට ගෙවිය යුතු ඉතිරි මුදල 5% ණය ගිණුමකට මාරු කරන ලදී.
අමතර තොරතුරු :-

සග 2018ග03ග31 දිනට අවසාන තොගය රු.35 000

සසග දේපළ පිරියත උපකරණ පිරිවැය මත 20% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි.

සසසග සඳුන්ගේ පෞද්ගලික රක්ෂණ ගාස්තු රු.2 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවා රක්ෂණ ගිණුමට හර කර ඇත.

සඬග ව්‍යාපාරයේ ගොඩනැගිලි කුලී රු.15 000 ක් හර්ෂ විසින් ගෙවා ඇත. ඒ පිළිබඳ කිසිදු සටහනක් නැත.

**අවශ්‍ය වන්නේ,**
2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සහ එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 13)**

I. ආශා හා නීෂා 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක නිරත වුහ. 2019. 03. 31 දිනට ව්‍යාපාරයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පහත දැක්වේ.

ආශා හා නීෂා හවුල් ව්‍යාපාරය
2019. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | රු. 000 |
| දේපල පිරියත හා උපකරණ | | 250 |
| ජංගම වත්කම් | | 130 |
| | | 380 |
| <u>ප්‍රාග්ධන ගිනුම්</u> | | |
| ආශා | 180 | |
| නීෂා | 90 | 270 |
| <u>ජංගම ගිනුම්</u> | | |
| ආශා | 18 | |
| නීෂා | 12 | 30 |
| ජංගම නොවන වගකීම් | | 50 |
| ජංගම වගකීම් | | 30 |
| | | 380 |

ii. 2019. 04. 01 දින ලාභයෙන් 1/6 ක් සඳහා ඊෂා ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී.
ඊෂා ප්‍රාග්ධනය ලෙස රු. 100 000/= ක් ව්‍යාපාරයට රැගෙන ආවේය. 2020. 03. 31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභය 154 500/= ක් වූ අතර පහත ගැලපීම් කිරීමට පෙර මෙම ලාභය ගණනය කොට තිබුණි.

1. ආශාගේ රු. 3 000/= ක පුද්ගලික රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් දරා ඇත.

2. නීශා සිය පුද්ගලික මුදලින් රු. 5 000/= ක ව්‍යාපාරික රක්ෂණ ගාස්තු ගෙවා තිබුණි.

3. 2020. 09. 30 න් අවසන් අර්ධ වර්ෂය සඳහා වූ රු. 12 000 ක ප්‍රචාරණ ගාස්තු කාලච්ඡේදයේ වියදමක් ලෙෂ සලකා ඇත.

4. නීෂා ගෙවූ විදුලි ගාස්තු 4 000/= ක් ව්‍යාපාරයෙහි වියදමක් ලෙස සලකා නොමැත.

5. මසකට රු. 3 000/= ක් ලබා දී මේ පොරොන්දුව මත ව්‍යාපාරයට යොදවා ඇති ආශාගේ ගොඩනැගිල්ල සඳහා වූ කුලිය 2020 වර්ෂයෙහි සිට 4 000/= දක්වා වැඩිකර ඇතත් ගාස්තු වැඩි වීම පිළිබඳ ගැලපීම් සිදු කොට නොමැත.

6. ජංගම නොවන වගකීම් 2019. 09. 30 දින ලබාගත් 10% බැංකු ණය වන අතර ඒ සඳහා අදාල පොලිය කාලච්ඡෙදයෙහි අවසන් දින වන විටත් ගෙවා නොමැත.

නව හවුල් ගිවිසුමේ පහත කරුණු ඇතුලත්ය :-

අ. ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත හවුල් කරුවන්ට 10% වාර්ෂික පොලියක් හිමි වේ.

ආ. ආශා, නීෂා, ඊශා පිළිවෙලින් රු. 2 000/= රු. 1 500/= හා රු. 1000/= බැගින් වූ මාසික වේතන සඳහා හිමිකම් කියති.

ආශා, නීශා, ඊසා ගිණුම් කාලච්ඡෙදය තුළ දී පිළිවෙලින් රු. 5000/= රු. 3 000/= හා රු. 2 000/= ක් බැගින්
ගැනිලි සිදු කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. විසර්ජනය කල හැකි නිවැරදි ලාභය

2. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ජංගම වත්කම් හා ජංගම වගකීම්.

**(හවුල් ව්‍යාපාර අභ්‍යාස 14)**

(i) හර්ෂ, සඳුන්, තාමර හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුමේ සඳහන් කොන්දේසි පහත පරිදි වේ.
(අ) ලාභලාභ 3:2:1 අනුපාතයට බෙදා ගනී.
(ආ) මාසික වැටුප් පිළිවෙළින් 3000,2000,1000 වේ.
(ඇ) ආරම්භක ප්‍රාග්ධන ශේෂ වෙනුවෙන් 5 ක පොලියක් ලබා දේ.

(ii) 2020ග03ග31 දින තාමර ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදී.
(අ) නව ලාභාලාභ අනුපාතය හර්ෂ, සඳුන් පිළිවෙළින් 2:1 වේ.
(ආ) මාසික වැටුප් පිළිවෙළින් 5 000.00, 3 000.00 වේ.
(ඇ) තාමරගේ මුලු හිමිකමින් 30% ක් මුදලින් ගෙවා ඉතිරිය නය ගිණුමකට මාරු කිරීමට
(ඇ)ගිවිසුමේ අනෙකුත් කරුණු වෙනස් නොවේ.

(iii) තාමර විශ්‍රාම ගන්නා දින කීර්තිනාමය රු.60 000 කට අගය කරන ලදී. කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් මඟින් ගලපනු ලැබේ.

**31.03.2020 දිනට ශේෂ පිරික්සුම**

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| හර්ෂ | | 120 000 |
| සඳුන් | | 120 000 |
| තාමර | | 140 000 |
| ජංගම ගිණුම | | |
| හර්ෂ | | 25 000 |
| සඳුන් | | 30 000 |
| තාමර | | 10 000 |
| ගැනිලි | | |
| හර්ෂ | 15 000 | |
| සඳුන් | 18 000 | |
| තාමර | 12 000 | |
| තොගය - 01/04/2019 | 26 000 | |
| ගැනුම් හා විකුණුම් | 384 000 | 818 000 |
| සේවක වැටුප් | 64 000 | |
| විදුලි ගාස්තු | 17 000 | |
| රක්ෂණ ගාස්තු | 12 000 | |
| වරිපනම් | 5 000 | |
| වට්ටම් | 3 000 | |
| බොල් හා අඩමාණ ණය සඳහා | | |
| ලියා හැරීම- 01/04/2019 | 2 000 | 9 000 |
| වෙළඳ ලැබිය යුතු දෑ හා | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 135 000 | 300 000 |
| දේපළ පිරියත හා උපකරණ | 1000 000 | 400 000 |
| මුදල් | 2 19 000 | |
| | 1 9 42 000 | 1 9 42 000 |

□□හර්ෂ විසින් රු.130 000 ක මුදලක් තාමරට විශ්‍රාම ගැන්වීම සඳහා ගෙවන ලදී.

□ තාමරට ගෙවිය යුතු ඉතිරි මුදල 5% ණය ගිණුමකට මාරු කරන ලදී.
අමතර තොරතුරු :-

i. 2020.03.31 දිනට අවසාන තොගය රු.35 000

ii. දේපළ පිරියත උපකරණ පිරිවැය මත 20% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි.

iii. සඳුන්ගේ පෞද්ගලික රක්ෂණ ගාස්තු රු.2 000 ව්‍යාපාරයේ මුදලින් ගෙවා රක්ෂණ ගිණුමට හර කර ඇත.

iv. ව්‍යාපාරයේ ගොඩනැගිලි කුලී රු.15 000 ක් හර්ෂ විසින් ගෙවා ඇත. ඒ පිළිබඳ කිසිදු සටහනක් නැත.

අවශ්‍ය වන්නේ,
2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය , ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

# කෙටි ප්‍රශ්න

01) A සහ B හවුල් ව්‍යාපාරයේ A සහ B ප්‍රාග්ධන මත 10% පොලී ලබාදීම වේතන වාර්ෂිකව පිළිවෙලින් රු. 50 000 හා රු. 80 000 ගෙවීම සිදුවේ. 2020.03.31 දිනට A සහ B හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම පහත දැක්වේ.

| | A | B | | A | B |
|---|---|---|---|---|---|
| ගැනිලි | 100 | 120 | ශේෂය 2019-04-01 | 300 | 420 |
| අලාභ කොටස් | 50 | 50 | ණය පොලී | 10 | - |
| | | | වේතන | 50 | 80 |
| 2020-03-31 ප/ගේ/ශේෂය | 310 | 480 | ප්‍රාග්ධන පොලී | 100 | 150 |
| | 460 | 650 | | 460 | 650 |

මෙම ව්‍යාපාරයේ පැවැති ශුද්ධ ලාභය වන්නේ (re' 000)

(1) 390 (2) 380 (3) 280 (4) 100 (5) (100)

02) හිරු, සඳු හා තරු 3:2:1 ලෙස ලාභාංශ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2020ග01ග01 දිනට පැවැති ශේෂය හා හවුල් ගිවිසුමේ කොන්දේසි මෙසේය. රු. 000
හිරු සඳු තරු

ප්‍රාග්ධන ගිණුමේ ශේෂය 300 ,200, 100
ජංගම ගිණුමේ ශේෂය : 50 . 40. 30

1) සෑම හවුල්කරුවෙකුටම වාර්ෂික රු. 60 000 ක වේතනයක් හිමි වේ.

2) වාර්ෂිකව රු. 40 000 ක උපරිමයකට යටත් ව ගැනිලි සිදු කල හැක.

අතිරේක තොරතුරු,

i. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 500 000 කි.

ii. හිරු, සඳු හා තරු අනුපිලිවෙලින් රු. 30 000 ක් රු. 25 000 ක් රු. 20 000 ක් ගැනිලි සිදු කර ඇත .

iii. තරු රු. 20 000 ක් වේතන ලෙස ලබාගෙන ඇත .

2020.12.31 දින තරු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගෙන තම ප්‍රාග්ධන කොටස ණය ගිණුමකට මාරු කිරීමට එකග වූයේ නම්, තරුගේ හිමිකම ණය ගිණුමක මාරු කිරීමට අදාල ජර්නල් සටහන වනුයේ,

.......................................................................................................................................

.......................................................................................................................................

03) තාරක, චාරුක හා චරිත සමසමව ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නියුතුව සිටි අතර 2019/04/01 දින චරිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. චරිත විශ්‍රාම ගැනීමේදී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 600,000 කට අගය කළ අතර එය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීමට එකඟ විය. එමෙන්ම චරිත විශ්‍රාම ගැනීමේ දී ඔහුට ගෙවිය යුතු හිමිකම නිරවුල් නොකොට ව්‍යාපාරයේ ණයක් ලෙස රඳවා ගැනීමට එකඟ විය. චරිත විශ්‍රාම ගැනීමෙන් පසු තාරක හා චාරුක 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගැනීමට එකඟ වන ලදී. 2020/03/31 දිනට පහත ශේෂ පැවතුණි.

| | රු. ,000 |
|---|---|
| ප්‍රාග්ධන ගිණුම චරිත (කීර්තිනාමය ගැලපීමට පෙර) | 600 |
| ජංගම ගිණුම චරිත | (300) |

2020/03/31 න් අවසන් වර්ෂය සඳහා චරිතට ගෙවිය යුතු ණය පොළිය කීයද?

(1) රු. 20,000 කි. (2) රු. 25,000 කි. 3) රු. 30,000 කි.
(4) රු. 35,000 කි. (5) රු. 50,000 කි. (......)

04) හවුල් ව්‍යාපාරයක අත්‍යවශ්‍ය ගුණාංගයක් නොවන්නේ,
(1) ව්‍යාපාරික ස්වරූපයේ කටයුත්තක නිරත වීම.
(2) සාමූහිකත්වය මත තීරණ ගැනීම.
(3) අවම සාමාජිකයන් 02 ක් හා උපරිමය 20 කට සීමා වීම.
(4) ලාභ ලැබීමේ පරමාර්ථය.

(5) ලාභාලාභ සමසමව බෙදා ගැනීම. (......)

05) අමල්, නිමල් හා සිසිල් පිළිවෙලට 4:3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ආ හවුල් ව්‍යාපාරයෙන් 2020/03/31 දින සිසිල් විශ්‍රාම ගනී.
- විශ්‍රාම ගැනීමේ ගැලපීම් කිසිවක් කිරීමට පෙර 2019/04/01 දිනට සිසිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂය හා ජංගම ගිණුමේ හර ශේෂය පිළිවෙලින් රු. 300,000 හා 50,000 ක් විය.
- විශ්‍රාම ගැනීමේ දී සිසිල් පවරාගත් ලී බඩු වල පිරිවැය සමුච්චිත ක්ෂය හා පවරාගත් වටිනාකම පිළිවෙලින් රු. 90,000, රු. 30,000 ක් හා රු. 40,000 ක් වේ.
ව්‍යාපාරය විසින් තවදුරටත් ගෙවිය යුතු සිසිල්ගේ හිමිකම කොපමණ ද?
...................................................................................................................................

06) හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයට දායකත්වය ලබාදිය හැකි ප්‍රධාන ආකාර 03 ක් නම්කර එම දායකවීම් වලට ලැබෙන ප්‍රතිලාභ ඒ ඒ දායකවීම ඉදිරියෙන් ලියන්න.

...................................................................................................................................
...................................................................................................................................
...................................................................................................................................

**අංක 07 හා 08 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න**

චමත් හා සුදත් හවුල් ව්‍යාපාරයේ 2020.03.31න් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පහත දැක්වේ.

| | චමත් | සුදත් | | චමත් | සුදත් |
|---|---|---|---|---|---|
| | | | 2019-04-01 ඉ/ගේ/ශේ | 80000 | 60000 |
| | | | වේතන | 50000 | 40000 |
| | | | ප්‍රාග්ධන පොලී 10% | 30000 | 20000 |
| 2020-03-31 ප/ගෙ/ශේ | 220000 | 150000 | ලාභ කොටස් | 60000 | 30000 |
| | 220000 | 150000 | | 220000 | 150000 |

07) හවුල් ගිවිසුමක් නොමැතිව 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව මෙම හවුල් ව්‍යාපාරය කටයුතු කරන්නේ නම්, 2020-03-31 න් අවසන් වර්ෂයේ සුදත්ගේ ලාභ කොටස කොපමණ ද?
(1) රු. 45 000 (2) රු. 70 000
(3) රු. 90 000 (4) රු. 115 000 (5) රු. 185 000 (.............)

08) චමත් හා සුදත්ගේ හවුල් ව්‍යාපාරයේ 2020-03-31 න් අවසන් වර්ෂයේ ව්‍යාපාරය උපයාගත් ශුද්ධ ලාභය වන්නේ

1) රු 90 000 කි 2) රු. 230 000 කි. 3) රු. 370 000 කි. 4) රු.140 000 කි

5) රු 300 000 කි. (.............)

**ප්‍රශ්න අංක 09 හා 10 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

09) 2019.04.01 දින අමල් හා බිමල් පිළිවෙළින් රු. 600,000 න් හා රු.400,000 න් ආයෝජනය කරමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යන ලදී. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පහත තොරතුරු සපයා ඇත.

- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් හිමි වී ඇත.

- අමල් හා බිමල්ට පිළිවෙලින් රු. 100,000 හා රු. 60000 බැගින් වාර්ෂික වේතන හිමි වි ඇත.

- අමල් හා බිමල්ට පිළිවෙලින් රු. 60000 ක් හා රු. 40000 ක අවසාන ලාභ කොටස් ලෙස හිමි වී ඇත.

- 2020.03.30 දින ඉදිරි වර්ෂයේ විකුණුම් සඳහා චෙක්පතකින් ලද අත්තිකාරම් මුදල් වූ රු. 50000, අමල් තම පුද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් තිබුණ ද ගිණුම්ගත කර නොතිබුණි.

- අමල් විසින් 2019.04.01 දින ව්‍යාපාරයට රු. 400,000 ක ණය මුදලක් සපයා තිබු අතර ඒ සඳහා ගිවිසගත් පොළියක් නොමැති බැවින්, පොළිය ගිණුම්ගත කර නොමැත.

10) 2020.03.31 දිනෙන් අවසන් වසර තුළ හවුල් ව්‍යාපාරය උපයා ඇති නිවැරදි ශුද්ධ ලාභය කොපමණද?

රු. ..........................................................

40. 2020.03.31 දිනට අමල් හා බිමල්ගේ ජංගම ගිණුම් ශේෂයන්,

අමල් රු. .......................................................... බිමල් රු. ..........................................................

**• පහත තොරතුරු ඇසුරින් අංක 11,12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අවන්ත, භවන්ත හා සිවන්ත පිළිවෙලින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2019.04.01 දින සිවන්ත විශ්‍රාම ගත් අතර එදිනට තක්සේරු කළ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුලින් ගැලපුම් කර ඇත. සිවන්තගේ මුළු හිමිකම රු. 200,000 වටිනාකම 10% ණය ගිණුමකට මාරු කරන ලදි.
2019.04.01 ට තිදෙනාගේ ජංගම ගිණුම් ශේෂ පිළිවෙලින් රු. 75,000 ක් 50,000 ක් හා 25,000 ක් වේ. එදිනට අවන්තගේ හා භවන්තගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ එකතුව රු. 600,000 වන අතර 2020.03.31 ට එය රු. 575,000 ක් විය.
අවන්තගේ හා භවන්ත ව්‍යාපාරය තව දුරටත් පවත්වා ගෙන ගිය අතර නව හවුල් ගිවිසුම අනුව 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමටත් ආරම්භක ප්‍රාග්ධන ශේෂවලට 10% වාර්ෂික පොළියක් ගෙවීමට හා මාසිකව රු. 10,000 බැගින් වේතන ගෙවීමට එකඟ විය. වර්ෂයේ උපයන ලද ලාභය රු. 380,000 කි.

11). 2019.04.01 දිනට සිවන්තගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය වන්නේ,

1. රු. 125,000  2. රු. 150,000  3. රු. 175,000
4. රු. 200,000  5. රු. 225,000  (.......)

12). 2019.03.31 අවන්ත හා භවන්තගේ ලාභ කොටස වන්නේ,

| | අවන්ත (රු.) | නිවන්ත (රු.) |
|---|---|---|
| 1. | 36,000 | 24,000 |
| 2. | 48,000 | 32,000 |
| 3. | 72,000 | 42,000 |
| 4. | 168,000 | 112,000 |
| 5. | 180,000 | 120,000 |

(.......)